# <u>උසස් පෙළ බුද්ධ ධර්මය</u>
# <u>නිපුණතාව 9.0</u>
# <u>නිපුණතා මට්ටම 9.1</u>

## ධනෝපායනය
## පරිභෝජනය
## සුරක්ෂිත භාවය
## කළමණාකරනය
## ආර්ථිකයෙන් ගොඩ නැගෙන
## ජීවන දර්ශනය

**කොටදූපේ සුමන හිමි**



www.pirivena.lk

## <u>ධනය පිළිබඳ බෞද්ධ ආකල්පය</u>

බුදු දහමේ ධනය පිළබඳව ඇති ආකල්පය ඉතා පුළුල් දර්ශනයක් මත හැඩගැසුනකි.ලෝකයා භෞතික ධනවත් කම පමණක් ධනය යන්නෙන් අර්ථකථනය කලද බුදු දහම "**භෞතික මෙන්ම ආධ්‍යාත්මික**"අංශ දෙකම ධනය යන මාතෘකාව යටතේ සාකච්ඡා කරයි. ඒ පිළිබඳ "**සංඛිත්ත ධන/වික්ඛිත්ත ධන/උග්ග මහාමත්ත**" ආදී සූත්‍ර දේශනා මගින් පැහැදිලි කොට ඇත.

ගෘහස්ථයාට දිළිඳු කම දුකක් බව බුදු දහම පිළිගනී. ( **දාළිද්දියං භික්ඛවෙ, දුක්ඛං ලොකස්මිං කාමභොගිනො"ති**) (අ නි ඉණ සූත්‍රය)

භෞතික ධනයෙන් පොහොසත් වීම ගෘහස්ථයෙක් වශයෙන් අත්‍යාවශ්‍යය. දිළිඳු වීමෙන් ගෘහස්ථයාට මුහුණ දීමට වන ප්‍රශ්න රාශියක්ද බුදුන් වහන්සේ දේශනා කොට ඇත. එනම්

01 ණය ගැනීම (**ඉණං ආදියති**)
02 පොලී ගෙවීම (**වඩ්ඪිං පටිස්සුණාති**)
03 චෝදනාවට ලක්වීම (**චොදෙන්තිපි නං**)
04 පසු පස ලුහුබැඳීම (**අනුචරන්තිපි නං**)
05 සිරගත කිරීම (**බන්ධන්තිපි නං**)

මේ ආදී වශයෙන් භෞතික ධනයෙන් පොහොසත් නොවූ ගිහියාට ඒ ඒ අවස්ථාවන් වලදී මුහුණ පෑමට සිදුවන තත්වය බුදු දහම පැහැදිලි කොට ඇත.ඒ නිසා ගිහියාට ධනය අත්‍යාවශ්‍ය සාධකයකි. එසේ ධනවත් වීම පමණක්ම මිනිසෙක් වශයෙන් ප්‍රමාණවත් නොවේ. එවන් තැනැත්තා එක් ඇසක් ඇති තැනැත්තෙක් හැටියට පෙන්වා දෙයි.ඒ නිසා ආධ්‍යාත්මික ධනයෙන්ද පොහොසත් අයෙක් විය යුතුය.ඇසුරට ගන්නේ නම්





වැලකීම නිසා සමාජීය වශයෙන් කීර්තිමත්ව ජීවත් වීමේ හැකියාව ඇත.

කුමනාකාරයට ධනය ඉපැයුවත් පරිභෝග කලත් ආරක්ෂා කලත් ප්‍රයෝජන ගත්තත් ඒ සියල්ලම ලෝක ධර්ම හා යටත් බව වටහා ගනිමින් අනෙකාගේ ධනයට භෝගයන්ට සම්පත් වලට ආශා නොකොට ලද සම්පත් සතුටින් තම අඹු දරුවන් දැසි දස්සන් හිත මිතුරන් සමග පරිභෝජනය කරමින් සමාජයට රටට ආගමික සංස්ථාවන්ට විය යුතු යුතු කම් පවා නොපිරිහෙලා ඉටු කරමින් කවදා හරි මේ සියලල් දමා පරලොව යා යුතුයි යන අත්හැරීමේ නුවණින් යුකුතව (**නිස්සරණ පඤ්ඤා පරිභුඤ්ජති**) පරිභෝග කරයි. බෞද්ධ ආර්ථිකය හා බද්ධ පුදුගලයාගේ ජීවන දර්ශනය අවසාන වශයෙන් නිවන් පිළිවෙත අරමුණු කරගෙනම සැකසී ඇති බව මේ අනුව පැහැදිලිය.



www.pirivena.lk

සාමකාමී විවේක නීරෝගීමත් මනසකින් යුක්තව ක්‍රියා කිරීමට බෞද්ධ ආර්ථික දර්ශනය පුද්ගලයා යොමු කරයි.

සංඝ සමාජයේ ඇති පහසුවෙන් පෝෂණය කල හැකි වීම (**සුභරෝ**) ලද දෙයින් සතුටු වීම (**සන්තුස්සකෝ**) ආදී ගුණ ධර්ම ආදර්ශනය කරමින් ගිහියාට ද එවන් ජීවන ප්‍රතිපදාවකට අදාල උපදේශනය ලබා දෙයි. එයින් සැහැසි නොවී (**අසාහසේන**) සම්පත් වලට හානියක් නොකොට (**භමරස්සේව ඉරීයතෝ**) සම්පත් අරපිරිමැස්මෙන් යුක්තව (**ජිණ්ණං පටිසංකරොන්ති**) කටයුතු කිරීමට අවකාශ සලසා දෙයි.

ධාර්මිකව ධනය ඉපයීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජීය පැවැත්මටත් දායකත්වයක් ලබා දෙයි. **තාලකූට මානකූට** ආදී ක්‍රම මෙන්ම **සත්ව ආයුධ මස් මාංස** ආදී නොකලයුතු වෙළඳාම් වලින් වැලකීම සමාජයේ යහපැවැත්මට තමන්ගේ දායකත්වය ලබාදීමක් ලෙස සැලකේ. ධාර්මික ධනෝපායනයේ යෙදීම නිසා රාජ්‍ය තන්ත්‍රයට පවා පහසු ලෙස රට පාලනය කිරීමේ හැකියාව ඇත. රට විනාශ කරන සොර මුල් (**දස්සුඛීලය**) ඇති නොවේ.(**දී නි කූටදන්ත සූත්‍රය**)

සමාජ සංස්ථාව තුල නොපිරිහුණු චරිතයක් ගොඩ නගා ගැනීමට (**තං පරාභවතෝ මුඛං**) බෞද්ධ ආර්ථික දර්ශනය උපදෙස් දෙයි. ස්ත්‍රී ධූර්ත වීම(**ඉත්ථිධුත්තෝ**) සුරාමට ලොල් වීම( **සුරා ධුත්තෝ**) සූදුවට ලොල් වීම (**අක්ඛ ධුත්තෝ**) අලස වීම (**අලසෝ**) තනියෙන්ම කෑම (**ඒකෝ භුඤ්ජති**) පරදාර සේවනය (**පරදාරේසු**) ආදී පරාභවයට හේතුවන කාරණා වලින්





මේ අංශ දෙකම සමෘධ කරරගත් තැනැත්තාම ඇසුරු කලයුතු බවත් අනෙක් අය දුරින්ම දුරු කලයුතු බව බුදු දහමේ අදහසයි.

**අන්ධඤ්ච එකචක්ඛුං ච - ආරකා පරිවජ්ජයේ**
**ද්විචක්ඛු පන සේවේථ - සෙට්ඨං පුරිස පුග්ගලෝ**
(අ නි අන්ධ සූත්‍රය)

ආධ්‍යාත්මික වශයෙන් පුද්ගලයෙක් සතු විය යුතු ධනය මොනවාද යන්න "**අ නි සංඛිත්ත ධන වික්ඛිත්ත ධන**" යන සූත්‍ර වලදී පෙන්වා දී ඇත. එනම්

01 ශ්‍රද්ධා ධනය (**සද්ධා ධනං**)
02 සීල ධනය (**සීල ධනං**)
03 හිරි ධනය ( **හිරි ධනං**)
04 ඔත්තප්ප ධනය ( **ඔත්තප්ප ධනං**)
05 ශ්‍රැත ධනය (**සුත ධනං**)
06 පරිත්‍යාග ධනය (**චාග ධනං**)
07 ප්‍රඥා ධනය (**පඤ්ඤා ධනං**)

ආදී වශයෙන් පෙන්වා දී ඇත. භෞතික ධනය කෙසේ තිබුණත් මේ ධනයෙන් ආඪ්‍ය නොවුනා දිළින්දෙකි. යමෙක් තුල මේ ධනයන් පවතීද භෞතික ධනයෙන් පොහොසත් නොවුණත් ලෝකය තුල පොහොසතෙක් යන ව්‍යවහාරයට පත්වන බව පෙන්වා දෙන අතර ඔහුගේ ජීවිතය **නොසිස්** ජීවිතයක් ලෙස බුදු දහම අර්ථ දක්වයි.( **අදළිද්දදෝති තං ආහු අමෝඝං තස්ස ජීවිතං**) මෙහිදී වටිනාම ධනය ලෙස ප්‍රඥාව ලෙස ධර්මයේ කිප තැනකම දක්වා ඇත. කුමන ජීවිතයට ශ්‍රේෂ්ඨ යන ප්‍රශ්නය ඇසූ විට (**කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති**) දුන් පිළිතුර වන්නේ ප්‍රඥා සම්පන්න ජීවිතය ශ්‍රේෂ්ඨ බවයි(**පඤ්ඤා ජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති**)(ආලවක සූත්‍රය) ප්‍රඥාව නැත්තම් භෞතික ධනවත් භාවය පමණක් ඇත්නම් ඔහු



www.pirivena.lk

ජීවත් නොවන්නෙක් ලෙස දක්වා ඇත.(**පඤ්ඤාය ච අලාභේන විත්තවාපි න ජීවති**)

එසේම ඉණ සූත්‍ර කාරණා ආධ්‍යාත්මික වශයෙන් ගලපන බුදුන් වහන්සේ පෙන්වා දෙන්නේ ශ්‍රද්ධාව වීර්යය ශ්‍රැතය චාගය ප්‍රඥාව නැත්තා දිළින්දෙක් ලෙසත්,ඔහු කයින් වචනයෙන් දුශ්චරිත කිරීම ණය ගැනීමක් ලෙසත්,ඒවාට විපාක විඳීම පොළිය ගැනීම ලෙසත්,තමා විසින්ම තමාට බැන වැදීම චෝදනාව ලෙසත්,එම පව් පසු පස පැමිණීම ලුහු බැඳීම ලෙසත්,මරණින් පසු නිරය තිරිසන් ලෝකයේ උප්පත්තිය ලැබීම බන්ධනය ලෙසත් පෙන්වා දී ඇත. ඒ නිසා මෙයින් වැදගත් වන්නේ භෞතික පොහොසත් භාවයට වඩා ආධ්‍යාත්මික පොහොසත් භාවයයි.

මිනිසා විසින් රැස් කරගත යුතු නිධන් හතරක් බුදු දහම දක්වයි. එනම් "**ථාවර,ජංගම,අංගසම හා අනුගාමික**" වශයෙනි. මෙයින් මුල් තුනම විනාශ වන නමුත් සිව් වැන්න විනාශ නොවී යන යන තැන තම සමග යන බව පෙන්වා දෙයි.(**පහාය ගමනීයේසු ඒතං ආදාය ගච්ඡති**)(නිධිකණ්ඩ සූත්‍රය) කුමන සම්පත් තිබුණත් "**සප්ත බොජ්ඣංග ධර්ම**" පුහුණු නොකල තැනැත්තා දිළින්දෙක් ලෙස දක්වා ඇත(**සත්තන්නං ඛො, භික්ඛු, බොජ්ඣඞ්ගානං අභාවිතත්තා අබහුලීකතත්තා 'දලිද්දො'ති වුච්චති**)(ස නි දළිද්ද සූත්‍රය)

බුදුන් හමුවට වරක් පැමිණි "**උග්ගමහාමත්ත**" නැමැත්තා "**රෝහණ නම් මිගාර**" නැමැත්තාට ඇති ලක්ෂ සංඛ්‍යාත ධනය පිළිබඳ පැහැදිලි කල විටදී බුදුන් දේශනා කළේ "**මම ඔහුගේ ඇත්තා වූ ධනය නැතැයි කියමි**" යනුවෙනි.( **අත්ථි ඛො එතං, උග්ග, ධනං නෙතං 'නත්ථී'ති වදාමීති** ) එයට හේතුව වශයෙන් දක්වන්නේ ඒ ධනය ඕනෑම කෙනෙකුට සාධාරණ බැවිනි.නමුත් ආධ්‍යාත්මිකව ලබා ඇති ධනය කිසි කෙනෙකුට සාධාරන නොවන බවත් (**ධනානි අසාධාරණානි අග්ගිනා**





වශයෙන් ආනනද හිමියන් පිළිතුරු දුන්නේය. බුද්ධ පුතුන්ගේ සම්පත් කලමණාකරණය පිළිබඳ පැහැදුණු උදේන රජු තවත් සළු පන්සියයක් පූජා කල බව විනය පිටකයේ දක්වා ඇත. ( චු පා 2 560 562)

ඒ නිසා සම්පත් පරිභෝජනයේ දී ඒවාට ඇලෙන්නේ නැතිව (**අගථිතෝ**) මුසපත් නොවී (**අමුච්ඡිතෝ**) වහලෙක් නොවී (**අනජ්ඣාපන්නෝ**) ආදීනව දකිමින් (**ආදීනව දස්සාවි**) අත්හැර යා යුතු දේවල් ලෙස සලකමින් (**නිස්සරන පඤ්ඤා** ) පරභෝජනය කිරීමෙන් අපයන ලද සම්පත් වල සුරක්ෂිත භාවය තහවුරු වේ.

## <u>ආර්ථිකය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පදනම් කරගත් ජීවන දර්ශනය</u>

ඉහත දක්වා ඇති සියළුම ක්‍රියාවලිය ධර්මානුකූලව සිදු වි ඇති බැවින් බෞද්ධ ආර්ථික දර්ශනය තුල මිනිසා ධර්මානුකූල ජීවිතයක් ගතකරයි.( **ධම්මේන භොගේ පර්යේසති,ධම්මිකෙහි ධම්ම ලද්ධෙහි**)යන දේශනා තුලින් එය ප්‍රකට වේ.

**ත්‍රිලක්ෂණය කර්මය පුනර්භවය මධ්‍යම ප්‍රතිපදාව පටිච්ච සමුප්පපාදය** යන ඉගැන්වීම් මත පදනම්ව ආර්ථික ප්‍රතිපත්ති සකස් කර ගැනිම තුල කනස්සල්ලෙන් තොරව දිවි ගෙවන්නටත් **අටලෝ** දහමින් කම්පා නොවුන කෙනෙක් ලෙස(**ඵුට්ඨස්ස ලෝක ධම්මෙහි චිත්තං යස්ස න කම්පති**) ජීවත් වෙයි. එයින් මානසික අසහනයෙන් මිදෙයි.



www.pirivena.lk

“ **අ නි කුල සූත්‍රය**” තුල සම්පත් සුරක්ෂිත භාවය පිළිබඳ අදහස් හතරක් පෙන්වා දී ඇත. ආයතනයක් ගෙයක් රටක් සුරක්ෂිත වීමට මේ කරුණු ඉටු වීම අනිවාර්යය.

01 නැසුනු සම්පත් ඉපයීම (**නට්ඨං ගවේසසති**)
02 දිරූ දෑ ප්‍රතිසංස්කරණය (**ජිණ්ණං පටිසංකරොන්ති**)
03 ප්‍රමාණාත්මක පරිභෝජනය (**පරිමිත පාණ භෝජනා**)
04 සිල්වත් තැනැත්තෙක් අධිපතිකම දැරීම
(**සීලවන්තං ඉත්ථිං වා පුරිසං වා ආධිපච්චේ ඨපෙන්ති**)

විනය පිටකයේ ද බුදුන් වහන්සේ තම ආරාමයේ ඇති භෞතික සම්පත් දීර්ඝ කාලීන සුරක්ෂිත භාවය වෙනුවෙන් විනය නියමයන් “**වත්තක්ඛන්ධකය**” තුල පෙන්වා දී ඇත. ඒවා රැකීම සාමූහික වගකීමක් බව අවධාරණය කරයි. ආනන්ද හිමියන් සළු පන්සියයක් ලබාග පුවතින් පසු උදේන රජු හා ආනන්ද හිමියන් අතර ඇතිවූ සංවාදයෙන් පෙනෙන්නේද ශාසනය තුල ඇති සම්පත් කලමණාකාරීත්වයයි.එහිදී

01 මේ සළු දුබල සිවුරු ඇති අයට ලබා දීම
02 දුබල සිවුරු වලින් ඇඳ ඇතිරිලි ද
03 පැරණි ඇඳ ඇතිරිලිවලින් කොට්ට උර ද
04 කොට්ට උර වලින් බුමුතුරුණු ද
05 බුමුතුරුණු වලින් පාපිසි ද
06 පැරණි පාපිසි වලින් දූවිලි පිස්නයන් ද
07 දූවිලි පිස්නයන් එකතු කොට මැටි සමග මිශ්‍ර කොට බිත්තියේ ආලේප කිරීම ද





**උදකෙන රාජූහි චොරෙහි අප්පියෙහි දායාදෙහි)** බුදුන් වහන්සේ පෙන්වා දී ඇත.

මේ අනුව බුදු දහමේ ධනයට හිමි තැන පැහැදිලිය. මිල මුදලින් පොහොසත් වුවත් ගුණ ධර්ම වලින් පොහොසත් නැත්නම් ඔහු හිස් දිළින්දෙක් පමණි. හේතුව ඒ ධනයෙන් දීර්ඝායුෂ ලැබිය නොහැක.(**න දීඝමායු ලභතේ ධනේන**) එයින් ජරාවට පත් නොවී සිටිය නොහැක.(**න චාපි විත්තේන ජරං විහන්ති**) ඒ අනුව ධනය යනුවෙන් බුදු දහම හඳුන්න්නේ ආධ්‍යාත්මික සතුටයි.(**සන්තුට්ඨී පරමං ධනං**)

## <u>ඉපයීම ආයෝජනය හා පරිභෝජනය</u>

සමාජීය වශයෙන් තවත් වැදගත් මාතෘකාවක් ලෙස ඉපයීම පරිභෝජනය හා ආයෝජනය පෙන්වා දිය හැක. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ **සම්මා ආජීවය** යනුවෙන් දැක්වෙන්නේ මේ කාර්යයයි.ආජීව අෂ්ටමක ශීලයේදී **මිච්ඡාජීවා වේරමණී** යනුවෙන් හැඳින්වෙන්නේද මෙයයි. බුදු මග යන්නෙක් විසින් තමන්ගේ ආර්ථික සාධනය කෙසේ කල යුතුද යන්න බුදු දහමේ පෙන්වා දී ඇත.

ඉපයිය යුත්තේ ඉතා සාධාරණවය. සම්පත් වලට හානියක් නොකොට එයත් පවත්වාගෙය යමින් ඉපයීමේ කාර්යය සිදු කල යුතුය.එය උපමා කරන්නේ **බඹරෙකුගේ** ඉරියව්වකටයි. බමරා තමන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් රොන් ගත්තත් මලට හානියක් නොකරයි. මිනිසාද ඉපයීම කලයුත්තේ සම්පත්වල පැවැත්මද තහවුරු කරමින්ය.

**(භොගේ සංහරමානස්ස භමරස්සේව ඉරීයතෝ)**
(දී නි සිඟාල සූත්‍රය)



www.pirivena.lk

මනුෂ්‍යයෙකුට ප්‍රමාණවත් ධනයක් ඇතුව තම ජීවිකාව ගත කිරීම අවනම්බුවකට ලක්නොවී ජීවත් වීමට මග පෑදේ.එය **"අත්ථි සුඛය,භෝග සුඛය,අණන සුඛය හා අනවජ්ජ සුඛය"** යනුවෙන් **"අ නි අණන සූත්‍රය"** පෙන්වා දී ඇත.
**( අත්ථිසුඛං, භොගසුඛං, ආනණ්‍යසුඛං අනවජ්ජසුඛං)**

ධනෝපායනයේ දී වැදගත්ම සාධකයක් වන්නේ **වීර්යයි**. එය බුද්ධ දේශනා කීපයකදී ම අවධාරණයට ලක් කරයි.**"දැන් සීතලය දැන් උෂ්ණය දැන් සවස් වී ඇත දැන් උදේය"** ආදී වශයෙන් කල්පනා කරන්නා **කළුවර පක්ෂයේ සඳ** මෙන් පිරිහීමට පත් වන බවත් **(කාලපක්ඛෙව චන්දිමා)** ඒවා තණපතකට පමණවත් නොසලකන්නාගේ ජීවිතයේ **පුර පස සඳ** මෙන් වැඩෙන බව **(සුක්ඛපක්ඛෙව චන්දිමා)** දක්වා ඇත.
**ස නි ආලවක** සූත්‍රය තුලදී දුක ඉක්මවන්නේ කෙසේද යයි ඇසූ ප්‍රශ්නයට දුන් පිළිතුර වූයේ වීර්යෙන් දුක් හෙවත් දුප්පත් කම් නැති කර හැකි බවයි.**(විරියේන දුක්ඛං අච්චේති) අ නි ව්‍යග්ගපජ්ජ** සූත්‍ර දේශනාව තුලදී මෙලව සාර්ථක වන තැනැත්තාගේ මුල්ම කාරණය ලෙස දක්වන්නේද **උත්සාහයයි.** එය සම්පත්තියක් ලෙස දියුණු කිරීම සංවර්ධනයට මග කියාදේ.**(උට්ඨාන සම්පදා)**

**මහිච්ඡතාව** ධනොපායනයේදී සමාජීය වශයෙන් ගැටළු උපදවයි. තමන්ගේ ප්‍රමාණය දැනගෙන අල්පේච්ඡව කටයුතු කිරීම ඉතා වටී.ලද පමණින් සතුටුවීම **(සන්තුස්සකෝ)** පහසුවෙන් පෝෂණය කල හැකි කෙනෙක් වීම **(සුභරෝ)** අල්පකෘත්‍ය ඇති බව **(අප්පකිච්ච)** ආදිය අල්පේච්ඡතාව ප්‍රගුණ කිරීමේ ලක්ෂණ ලෙස දැක්වේ. ජනයාට ධාර්මික ධනෝපානය මාර්ග සකස් කර දීම රාජ්‍යයක යුතුකම් බවත් බුදු දහම අවධාරණය කරයි. **දී නි කූටදන්ත සූත්‍රය** තුල රජය මැදිහත් වීමෙන් කල යුතු කාර්ය තුනක් දක්වා ඇත. එනම්,





**(කතමානි ඡ භොගානං අපායමුඛානි න සෙවති? සුරාමෙරයමජ්ජප්පමාදට්ඨානානුයොගො ඛො, ගහපතිපුත්ත, භොගානං අපායමුඛං, විකාලවිසිඛාචරියානුයොගො භොගානං අපායමුඛං, සමජ්ජාභිචරණං භොගානං අපායමුඛං, ජූතප්පමාදට්ඨානානුයොගො භොගානං අපායමුඛං, පාපමිත්තානුයොගො භොගානං අපායමුඛං, ආලස්‍යානුයොගො භොගානං අපායමුඛං.)**

**" අ නි පත්තකම්ම සූත්‍රය"** ධනය සුරක්ෂිත කිරීම හා කලමණාකරණය පිළිබඳ අදහස් ඉදිරිපත් කොට ඇත. ධනය විනාශ වීමට ස්වභාවික ආපදා හේතු වේ. ඒවාට මුහුණ දීමට අවශ්‍ය කටයුතු කර තිබීම ධනයේ සුරක්ෂිත භාවයට හේතු වේ.

**(යා තා හොන්ති ආපදා අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියතො වා දායාදතො තථාරූපාසු ආපදාසු පරියොධාය සංවත්තති)**

එසේම මනා ධන කලමණාකරණය නම් ඒ ඒ කොට්ඨාසයන් වෙනුවෙන් වෙන් කිරීමයි. **තමා දෙමාපියන් දැසි දස් කම්කරුවන් හිත මිතුරන්** ආදීන් වෙනුවෙන් ධනය වෙන් කිරීම.

**(අත්තානං සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. මාතාපිතරො සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. පුත්තදාරදාසකම්මකරපොරිසෙ සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. මිත්තාමච්චෙ සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති)**
අනතුරුව පංච බලි පැවැත්වීම. එනම් **"රජුන්,දෙවියන්, ආගන්තුකයන්,ඤාතීන්,මලවුන්"** ආදීන් වෙනුවෙන් වෙන් කිරීම.

**(පඤ්චබලිං කත්තා හොති - ඤාතිබලිං, අතිථිබලිං, පුබ්බපෙතබලිං, රාජබලිං, දෙවතාබලිං)**



www.pirivena.lk

ධන පරිභෝජනයේ දී තවත් වැදගත් සාධකයක් ලෙස "**සමජීවිකතාව**" දක්වා ඇත. සෑම විටම අය වැය සම තත්වයේ තබා ගැනීම වැදගත්ය. අයට වඩා වැය පක්ෂයත්, වැයට වඩා අය පක්ෂයත් ඉක්මවා නොයන පරිදි පරිභෝජන රටාව සකස් කර ගත යුතුය.( **ආයො වයං පරියාදාය ඨස්සති, න ච මෙ වයො ආයං පරියාදාය ඨස්සතී'ති**) එහිදී "**තුලාධාර උපමාව, උදුම්බර උපමාව, තලාකෝපමාව**" ආදියෙන්ද පෙන්වා දී ඇත්තේ අය වැය තුලනය කර ගනිමින් කරන ධන පරිභෝජනයි.

## ආර්ථික සුරක්ෂිත භාවය හා සම්පත් කළමනාකරණය

බුදු දහම උපයාගත් ධනය සුරක්ෂිත කර ගැනීමට විවිධ උපදෙස් ලබාදෙයි. "**අ නි ව්‍යග්ඝපජ්ජ සූත්‍රය**" මෙසේ ක්‍රම 4ක් කියා දෙයි.

01 උත්සාහය (**උට්ඨාන සම්පදා**)
02 ආරක්ෂා කර ගැනීම (**ආරක්ඛ සම්පදා**)
03 කලණ මිතුරු ඇසුර (**කල්‍යාණ මිත්තා**)
04 අයවැය තුලනය (**සමජීවිකතා**)

"**දී නි සිඟාලෝවාද සූත්‍රය**" තුල ආර්ථික සුරක්ෂිත භාවය නැති කරණ අපාය මුඛ හයක් දේශනා කොට ඇත. එයින් වැලකී ක්‍රියා කිරීම මගින් ආර්ථිකය රැක ගත හැක.

01 මත් පැන් පානය
02 නොකල්හි වීථි සංචාරය
03 නාට්‍ය සංදර්ශන බැලීමට යාම
04 සූදුවට ලොල් වීම
05 පාප මිත්‍ර ඇසුර
06 අලසකම





01ගොවියන්ටට බිත්තර වී ලබා දීම.
( **තෙසං භවං රාජා බීජභත්තං අනුප්පදෙතු**)
02 වෙළන්දන්ට භාණ්වලට ස්ථාවර මිලක් ලබා දීම. (**පාභතං අනුප්පදෙතු**)
03 රාජ්‍ය සේවකයන්ට බත් වැටුප් ගෙවීම. (**භත්තවෙතනං පකප්පෙතු**)

එවිට ධාර්මික ලෙස ධනය උපයනවා මෙන්ම රටේ **සමෘධිය,ආරක්ෂාව,ධාර්මික හැසිරීම** ආදී විවිධ ප්‍රතිඵලයන් අපේක්ෂා කල හැකි එම සූත්‍රය තුල වැඩි දුරටත් දක්වා ඇත.

ධනය ඉපයීමේදී වැරදි ජීවන ක්‍රම අතහැරීම බුදු දහමේ නිර්දේශයයි. එවන් ධනය තුල තෘප්තියක් නැත. එනම් වහල් වෙළඳාම (**සත්ත වණිජ්ජා**)ආයුධ වෙළඳාම (**සත්ථ වණිජ්ජා**) මත්ද්‍රව්‍ය වෙළඳාම (**මජ්ජ වණිජ්ජා**) මස් මාංස වෙළඳාම (**මංස වණිජ්ජා**) වස විස වෙළඳාම ( **විස වණිජ්ජා**) ආදියෙන් වැළකීමත්, විවිධ වැරදි කිරුම් මිණුම් ක්‍රම භාවිතා කිරීමෙන්ද වැළකීම බුදු දහම අගය කරයි. ඒ වෙනුවට කෘෂි කර්මාන්තය (**යදි කසියා**) ගව පාලනය (**යදි ගොරක්ඛ**) රාජ්‍ය සේවය (**යදි රාජපොරිස**) ආදී ධාර්මික ක්‍රම මගින් කාටවත් හිංසාවක් නොවන පරිදි ඉපයීමේ ක්‍රියාවලියේ යෙදිය යුතුය.

උපයාගත් ධනය මනා **පරිභෝජනයට** ලක් කර ගැනීම සහ ඒ ඒ කොටස් වෙනුවෙන් **ආයෝජනය** කල යුතු ආකාරයත් බුදු දහම පෙන්වා දී ඇත. එක් කෙනෙකු වටා ධනය සියල්ලම ගොනු වීම බුදු දහම අගය නොකරයි. ඇත්තා නැත්තා වෙනුවෙන් යුතුකම් ඉටු කිරීම වටී. ධන පරිභෝජනයේදී "**එක්ක කෑම වෙනුවෙන්ද, දෙකක් කර්මාන්තවල දියුණුව වෙනුවෙන්ද, එකක් ආපදාවලද ගැනීමටද**" වශයෙන් කොටස් චතුර්විධ විභජනය බුදු දහම පෙන්වා දෙයි.



www.pirivena.lk

**ඒකේන භෝගේ භුඤ්ජෙයා**
**ද්වීහි කම්මං පයෝජයේ**
**චතුත්ථං ච නිධාපෙයා**
**ආපදාසු භවිස්සති** ( දී නි සිඟාල සූත්‍රය)

ධන පරිභෝජනයේදී

01 **මා විසින් ධර්මිකව ධනය උපයා ඇත්තෙමි**
**02 එය ධාර්මිකව පරිහරණය කරන්නෙමි**
**03 ලොවේ කාටවත් ණය නොවී ජීවත් වන්නෙමි**
**04 ධනය වැය කොට ධර්මානුකූල ජීවිතයක් ගත කරන්නෙමි**

යන සන්තාප්තිය පුද්ගලයාට තිබිය යුතුය. එවන් තෘප්තියක් නැති නම් ඒ පරිභෝජනය ධර්මානුකූල නොවන බව "**අණන සූත්‍රය**" තුල දක්වා ඇත.

ධන පරිභෝනය හා අයෝජනය පිළිබඳ තවත් වටිනා දේශනාවක් ලෙස "**ස නි රාසිය සූත්‍රය**" දැක්විය හැක. එහි මෙසේ දක්වයි.

01 සැහැසිකමෙන් තොරව ධනය ඉපයීම
**(ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන,)**
02 තමා ලත් ධනයෙන් තමා දියුණු වීම
**(අත්තානං සුඛේති, පීණේති)**
03 අනෙක් අයට බෙදා දීම හා පින් කිරීම.
**(සංවිභජති පුඤ්ඤානි කරොන්ති)**
04 ධනයෙහි නොඇලී,ගිජු නොවී, මුසපත් නොවී,ආදීනව දකිමින්,අත්හැරිය යුතු දෙයක් යන හැඟීමෙන් පරිහරණය කිරීම
**(තේච භෝගේ අසථිතෝ අමුච්ඡිතෝ අනජ්ඣාපන්නෝ ආදීනව දස්සාවී නිස්සරණ පඤ්ඤා පරිභුඤ්ජති)**





"**අ නි පත්ත කම්ම සූත්‍රය**" ධනය යොමු විය යුතු ආයතන මොනවාද යන්න දක්වා ඇත. එනම්,

01දෙමාපියන්.අඹුදරුවන්,හිතමිතුරන්,සේවකසේවිකාවන්, වශයෙන් තමාගෙන් යැපෙන්නන්ට
**(අත්තානං සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. මාතාපිතරො සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. පුත්තදාරදාසකම්මකරපොරිසෙ සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. මිත්තාමච්චෙ සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති)**

02 ස්වභාවිකව ඇතිවන්නාවූ ආපදාවලින් වැළකීම වෙනුවෙන් ආයෝජනය කිරීම. **(යා තා හොන්ති ආපදා අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියතො වා දායාදතො තථාරූපාසු ආපදාසු පරියොධාය සංවත්තති. සොත්ථිං අත්තානං කරොති.)**

03 පඤ්ච බලි(යුතුකම්) වෙනුවෙන් යෙදවීම,
**(පඤ්චබලිං කත්තා හොති - ඤාතිබලිං, අතිථිබලිං, පුබ්බපෙතබලිං, රාජබලිං, දෙවතාබලිං)**

04 ආගමික පක්ෂය වෙනුවෙන් හා ඒවා මුල් කරගෙන පින් සිද්ධ කර ගැනීමට **(සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං)**
මෙසේ යොමුවන්නා වූ ධනය නියම තැනට සුදුසු තැනට පත්වූ ආයතනයේ පරිභෝග වූවක් සේ බුදු දහම සලකයි. **(ඨානගතං පත්තගතං අයතනසෝ පරිභුත්තං)**

සිල්වත්වව කටයුතු කිරීමෙන් කෙනෙකුට පොහොසත් විය හැකි බවත් බුදු දහම අවධාරණය කරයි. සිල්වත් වීමේ ආනිසංස පහක් ගෙනහැර දක්වන තැන "**සිල්වතා මහත් භෝගයන්ට උරුමකම් ලබයි**" යන්නෙන් ධනෝපායනයේදී සිල්වත් වීමේ වටිනාකම ද පෙන්වා දී ඇත.(**සීලවන්තෝ මහන්තං භෝගක්ඛන්ධං අධිගච්ඡති**) (දී නි පරිනිබ්බාණ සූත්‍රය)



www.pirivena.lk